## 5. දුක්ඛ ලක්‍ෂණය පිළිබඳව දතයුතු කරුණු

**පසුගිය ලිපි පෙලින් අපි ත්‍රිපිටක පෙළ අටුවා ටීකාවන්හි අනිත්‍ය යන්නට දුන් අර්ථකථනයන් මොනවාද, වර්තමානයේ ථේරීය ඇදුරන් ඒ අර්ථකථනයන් යොදාගෙනම විපස්සනා භාවනාව සිදුකරන්නේද යන්න විස්තර කළෙමු. මෙම ලිපියෙන් සංස්කාරයන්ගේ දුක්ඛ ලක්ෂණය පිළිබඳව ත්‍රිපිටක පෙළ අටුවාවන්හි පැමිණි අර්ථකථන විස්තර කරන්නෙමු.**

සෑම සත්ත්වයෙක් පාහේම සැපයට කැමති ය. සැපය ලබා ගැනීම පිණිස සත්ත්වයෝ නොකරන්නා වූ දෙයක් නම් නැත්තාහ. ඒ සඳහා ඔවුහු කුසල් ද අකුසල් ද කරන්නාහ. නමුත් සැප සොයන්නා වූ සත්ත්වයන්ට කොතරම් සැප ලැබුණේ ද නැවත නැවත දුකටම පත්වන්නේ ය. එයට හේතුව වනුයේ සැප වේදනාව ද ඇතුළුව සියලු සංඛත ධර්මයන් තුළ දුක්ඛ ලක්‍ෂණය ඇති බැවිනි. කුමන අර්ථයකින් සංස්කාරයෝ දුක්ඛයෝ ද යන පැනයට පෙළ අර්ථකථාවන්හි සඳහන් පිළිතුරු මෙසේ ය.

### I. පටිසම්භිදාප්‍රකරණය - අභිඤ්ඤෙය්‍යා නිර්දේශය

පටිසම්භිදාප්‍රකරණයෙහි අභිඤ්ඤෙය්‍යා නිර්දේශයෙහි දුක්ඛයාගේ දැනගතයුතු අර්ථ පිළිබඳව මෙසේ දැක්වේ.

- **“දුක්ඛස්ස පීළනට්ඨො අභිඤ්ඤෙය්‍යො; දුක්ඛස්ස සඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො; දුක්ඛස්ස සන්තාපට්ඨො අභිඤ්ඤෙය්‍යො; දුක්ඛස්ස විපරිණාමට්ඨො අභිඤ්ඤෙය්‍යො.”**

[දුඃඛයාගේ පීඩනාර්ථය දතයුතු යැ .දුඃඛයාගේ සඞ්ඛතාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ සන්තාපාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ විපරිණාමාර්ථය දතයුතු. (පටිසම්භිදාමග්ගප්පකරණය - ඤාණකථා - බු.ජ.මු. 34)]

<u>පටිසම්භිදාමග්ග අට්ඨකථාවෙහි ඒ සිවුපදයන් සඳහා මේ අර්ථ සපයා ඇත.</u>

- **“දුක්ඛදස්සනේනේව පීළනට්ඨො. දුක්ඛායූහනසමුදයදස්සනෙන සඞ්ඛතට්ඨො. සබ්බකිලෙසසන්තාපහරසුසීතලමග්ගදස්සනෙන සන්තාපට්ඨො. අවිපරිණාමධම්මනිරොධදස්සනෙන විපරිණාමට්ඨො.”**

[ඉපදීම බිඳීම දෙකින් වන දුක්ඛය දැක්වීම් වශයෙන් ම ‘පීළනාර්ථය’ය. සංස්කාරයන් ඉපිදවීමට ප්‍රත්‍ය රැස්කිරීමේ ඇති දුක්ඛිතභාවය දැක්වීම් වශයෙන් 'සංඛතාර්ථය' ය. සියලු කෙළෙස් දාහයන් වෙතට ගෙනයන මාර්ගය බව දැක්වීම් වශයෙන් ‘සන්තාපනාර්ථ’ය. සංස්කාර ධර්මයන් ගේ ජරාව නම් වූ විපරිණාමයත් මරණය නම් වූ නිරෝධයත් දැක්වීම් වශයෙන් ‘විපරිණාම ධම්මා’ය. (පටිසම්භිදාමග්ගප්පකරණ අ.ක. - අභිඤ්ඤෙය්‍යා නිද්දේසය - හේ.මු. 72)]

එහි පීළනාර්ථය යනු පීඩිත වන පෙළෙන බවය. සත්ත්‍වයෙකු ඉපදුණු ක්‍ෂණයෙහි මියයන්නේ නම් එම සත්වයා දුක්ඛිතයෙකැයි කියති. යම් වස්තුවක් ලැබී වහා නැති වී යන්නේ නම් එම වස්තුව දුක්ඛ සහගත දෙයකි. මෙහිදී අදහස් කරනුයේ ඒ සත්ත්‍වයා හෝ වස්තුව අයත් කරගෙන සිටින කෙනාට උපදින දුක නොව ඒ සත්ත්‍වයාගේ හෝ වස්තුවේ ඇති නැසීමෙන් කෙළවර වන බව නමැති අවාසනාවන්ත භාවයයි. දුක්සහගතභාවයි එමෙන් ම සියළු අවිඤ්ඤාණික සවිඤ්ඤාණික ධර්මයෝම ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඉපිද බිඳීයන බැවින් පීළනාර්ථයෙන් දුක්ඛයෝ ය.

එසේම සංස්කාරයන් ඉපදෙනුයේ ප්‍රත්‍යයන් එක් රැස්වීමෙනි. ඉදින් යම්ම දෙයක් ලබාගැනීමට නම් ඒ දෙය ලැබෙන හේතු ඒකරාශී කළ යුතුය. රැකියාවක් ලබාගැනීමට මහන්සි වී ඉගෙනගත යුතුය. යහපත් ජීවිතයක් ගත කිරීමට වෙහෙස වී මුදල් ඉපයිය යුතුය. මෙසේ සංස්කාර ඉපදවීමට කළ යුතු ප්‍රත්‍ය රැස්කිරීම දුකින් යුතුව වෙහෙසෙමින් කළ යුතු බැවින් සංඛතාර්ථයෙන් සංස්කාරයෝ දුක්ය හ.

තවද කෙලෙස්දාහයෙන් සත්ත්‍වයන් තවන බැවින් පංචුපාදානස්කන්ධ සංඛ්‍යාත සියළු ආත්මභාව දුක්ඛසහගතය. එසේම සියළු කාම වස්තු කෙලෙස් දාහය ඉපිදීමට හේතුවන බැවින් දුක්ඛයෝ ය. මෙසේ සියළු සංස්කාරයෝ කෙලෙස් දාහයෙන් තවන සන්තාපාර්ථයෙන් දුක්ඛයෝ ය.

කොතරම් වෙහෙස වී ලබාගන්නා දෙයක් වුවද කලකදී වෙනස් වී නැතිවී යන්නේය. සවිඤ්ඤාණක වස්තු ද ජරාවට මහළුබවට ආදියට පැමිණ මරණයෙන් කෙළවර වන්නේ ය. අවිඤ්ඤාණ වස්තු ද දිරායාමට පැමිණ විනාශ වී යන්නාහ. මෙසේ සියළු සංස්කාරයෝ ජරා මරණ දෙකින් හෙවත් විපරිණාමයට පත්ව නිරුද්ධවීම යන ස්වභාවයෙන් යුක්ත හෙයින් විපරිණාමාර්ථයෙන් දුක්ඛයෝ ය. දක්වන ලද සතර වැදෑරුම් ආකාරයන්ගෙන් ද සංස්කාරයෝ දුක්වන්නාහ.

## II. සංයුක්තනිකාය - රාහුල සංයුක්තය

තවද සංයුක්තනිකායෙහි රාහුල සංයුක්තයෙහි පළමු සූත්‍රයට ලියූ අර්ථකථාවෙහි මෙසේ සඳහන් වේ.

- **"දුක්ඛන්ති චතූහි කාරණෙහි දුක්ඛං දුක්ඛමනට්ඨෙන දුක්ඛවත්ථුකට්ඨෙන සතතසම්පීළනට්ඨෙන සුඛපටිපක්ඛෙනාති"**

["දුක්ඛං යනු සිව්කාරණයකින් 'දුක්ඛං' වේ. දුඃඛමනාර්ථයෙන්, දුකට වස්තුවන අර්ථයෙන්, නිරන්තරයෙන් පෙළන අර්ථයෙන්, සුඛයට ප්‍රතිපක්‍ෂ වන අර්ථයෙන් ය" (සංයුක්ත නිකාය අ.ක. II - රාහුල සංයුක්තය - හේ.මු.158)]

I. සංස්කාරයෝ දුකින් ඉවසියයුතු හෙයින් දුක්ඛයෝ ය. සංස්කාරයන් ගේ ඇති ජරා මරණ විපරිණාමය සංස්කාරයන් සමග ගණුදෙනු කරන්නන්ට දුකින් යුතුව ඉවසන්නට වන්නේය. එබැවින් සංස්කාරයෝ දුක්ඛයෝ ය.

II. ස්කන්ධයෝ දුකට වස්තු වන හෙයින් ද දුක්ඛය. දුක ඇතිවන්නේ ස්කන්ධයන් නිසාය. ස්කන්ධයන් පහළ වූ බැවින් නොහොත් සත්ත්‍වයන් උපන් බැවින් දුක උපදින්නේය. සත්ත්‍වයන් නූපන්නේ නම් දුකක් නැත. එබැවින් ම ස්කන්ධයන්ගේ අනුප්පාද නිරෝධයම සුවය යැයි කියති. මෙලෙස දුක්ඛයන්ට වස්තුවන හෙයින් ආධාරවන හෙයින් ස්කන්ධයෝ දුක්ඛයෝ යයි දත යුතුය.

III. ස්කන්ධයන් විසින් ස්කන්ධ සංඛ්‍යාත ආත්මභාවය පෙළන හෙයින් ද දුක් වේ. ජාති ජරා ව්‍යාධි මරණයට පත්වන්නේ ස්කන්ධයෝය. එසේ ජාත්‍යාදීන්ගෙන් නිරන්තරයෙන් පෙළන හෙයින් ස්කන්ධයෝ දුකය.

IV. ස්කන්ධයෝ සුඛයට ප්‍රතිපක්‍ෂ හෙයින් ද දුක්ඛයෝය. සුඛය නම් ස්කන්ධාදීන්ගෙන් තොර නිවනයි. ස්කන්ධයෝ යම් තැනක උපදිත් ද ඒ උපදිනුයේම දුක ය. ඒ නිසා ස්කන්ධයන්ගේ නොපැවතීම නම් පරම සුඛයට ප්‍රතිපක්‍ෂ නිසා ද ස්කන්ධයන් දුක්ඛ ය. මෙසේ ද සංස්කාරයෝ දුක්ඛයෝ ය.

## III. පටිසම්භිදාමග්ගප්පකරණය සම්මසන ඥාන නිර්දේශය

තවද පටිසම්භිදාමග්ගප්පකරණයෙහි සම්මසන ඥාන නිර්දේශයෙහි මෙසේ සඳහන් වේ .

❖ **"දුක්ඛං භයට්ඨෙන"**

එහි තේරුම නම් "භයාර්ථයෙන් සංස්කාරයෝ දුක්ඛ"ය යන්නයි. (බු.ජ.මු. 102)

සංස්කාරයෝ භය ඉපදීමට වස්තු වන නිසාත් භය උපදවන නිසාත් භයාර්ථයෙන් දුක්ඛ වේ. ඉදින් පංචඋපාදානස්කන්ධයක් නොතිබුණේ වී නම් භය උපදින්නේ නැත. පංචුපාදානස්කන්ධය වස්තු කරගෙනම භය උපදී. එසේම සත්ත්‍වයාට ජාති භය, ජරා භය, ව්‍යාධි භය, මරණ භය උපද්දවනුයේ ස්කන්ධයෝ ය. එබැවින් ස්කන්ධයෝ භය උපදවන්නෝය. මේ දෙඅරුතින් භයඅර්ථයෙන් ස්කන්ධයෝ දුක් වෙති.

මෙසේ සංස්කාරයෝ විවිධ අර්ථයන්ගෙන් දුක්ඛධර්මයෝ වෙති. මෙසේ නානාවිධ නයින් සංස්කාරයන්ගේ දුක්ඛ ලක්‍ෂණය දැකීම සංස්කාරයන් කෙරෙහි කලකිරීමක් ඇති වීමටත් ඉන් මිදීමේ බලවත් කැමැත්තක් ඇතිවීමටත් නිවන පරම සුවය සේ දැකීමටත් හේතුවේ.

**මීළඟ ලිපියෙන් සංස්කාරයන්ගේ අනාත්ම ලක්ෂණය පිළිබඳව විස්තර කරන්නෙමු.**